00034

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන

5 වන මට්ටම 2022/2023

අවසාන පරීක්ෂණය - 2023

SNU5237/ESU3137 - අධ්‍යාපනයේ සමාජ විද්‍යාත්මක පදනම

කාලය පැය තුනයි. (03)

---

දිනය - 2023.10.22 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 1 වන කොටස

01. "සමාජානුයෝජනය" යන පදය ඔබේ වචනයෙන් අර්ථ දක්වන්න.

02. මාග්‍රට් මීඩ්ගේ (Margaret Mead) 'අනෙකාගේ භූමිකා පවරා ගැනීම' යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

03. 'පවුල' යන පදය ඔබේ වචනයෙන් පැහැදිලි කරන්න.

04. රැපෝපෝට් සහ රැපෝපෝට් (Rapoport & Rapoport, 1982) සඳහන් කළ පවුල් අතර ඇති පස් ආකාර විවිධත්වයන් මොනවා ද?

05. 'සමුද්දේශ කණ්ඩායම' (Reference group) යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

06. 'ඉහළ සංචලනය' සහ 'පහළ සංචලනය' අතර වෙනස දක්වන්න.

07. ශ්‍රී ලාංකික අධ්‍යාපන පද්ධතියෙන් ළමුන් විපතිත වීමට (drop out) බලපාන සාධක දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. 'සහයෝගීතා ඉගෙනීම' යන සංකල්පය කෙටියෙන් පැහැදිලි කරන්න.

( ලකුණු 05 x08 = 40)

## 2 වන කොටස

09. (i) 'සංස්කෘතිය' යන පදය නිර්වචනය කරන්න. (ලකුණු 04)

(ii) සංස්කෘතියේ අත්‍යවශ්‍ය ගුණාංග (essential qualities) දෙක (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) 'ජනවාර්ගිකත්වය සමාජ පන්ති හෝ ආගම්වල විවිධත්වයේ ප්‍රතිඵලයක් ලෙස ප්‍රධාන සංස්කෘතිය තුළ නිශ්චිත උප සංස්කෘතීන් මතු විය හැකි ය.'
ඔබ ඉහත ප්‍රකාශය සමග එකඟ වේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

10. (i) පවුලක 'සිරස් ව්‍යාප්තිය (Vertical extension) සහ තිරස් ව්‍යාප්තිය (Horizontal extension) අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii) විවිධ හේතූන් නිසා විස්තෘත පවුල් න්‍යෂ්ටික පවුල් බවට සීඝ්‍රයෙන් වෙනස් වෙමින් පවතී. මෙම වෙනස්වීමට හේතු තුනක් (03) හඳුනා ගන්න. (ලකුණු 06)

(iii) 'ළමයින් සමාජානුයෝජනය සඳහා න්‍යෂ්ටික පවුලට වඩා විස්තෘත පවුල වඩාත් සුදුසු යි.'
ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නේ ද? ඔබේ පිළිතුරට හේතු දක්වන්න. (ලකුණු 10)

11. (i) සමාජමිතික තත්ත්ව කණ්ඩායම් (Socio -metric status groups) හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ ඉහතින් දැක් වූ සමාජමිතික තත්ත්ව කණ්ඩායම් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) විශේෂ අවශ්‍යතා සහිත දරුවකුගේ සංවර්ධනය සඳහා සමවයස් සම්බන්ධතාවයේ වැදගත්කම අගයන්න. (ලකුණු 10)

12. (i) 'සංස්කෘතික ප්‍රත්‍යුත්පාදනය' (Cultural reproduction) යන සංකල්පයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) පාසලෙන් අපේක්ෂිත සමාජානුයෝජන කාර්යය ඵලදායී අයුරින් ඉටු නොවීමට ඉඩ ඇත. එසේ වීමට හේතු තුනක් (03) ලබා දෙන්න. (ලකුණු 06)

(iii) "ජාතියේ සෑම ළමයකුටම ඒකාකාර සමාජානුයෝජනයක් සැපයීමට ශ්‍රී ලාංකික පාසල් පද්ධතියට නිසැකවම හැකියාවක් නොමැත."
ඉහත ප්‍රකාශය විවේචනාත්මකව අගයන්න. (ලකුණු 10 යි)

13. (i) පාසලේ ඉගෙනුම ලබන අතරතුර විශේෂ අවශ්‍යතා සහිත සිසුන් මුහුණ දෙන දුෂ්කරතා හතරක් (04) සඳහන් කරන්න. (ලකුණු 04)

(ii) ඔබ ඉහත සඳහන් කළ දුෂ්කරතා තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඔබ පැහැදිලි කළ දුෂ්කරතා ජය ගැනීමට ඔබගේ යෝජනා ඉදිරිපත් කරන්න. (ලකුණු 10)

14. (i) මාධ්‍ය සාක්ෂරතාව (media literacy) යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? (ලකුණු 04)

(ii) විශේෂ අවශ්‍යතා සහිත සිසුන්ගේ සංවර්ධනය සඳහා ධනාත්මක අයුරින් මාධ්‍ය භාවිත කරන්නේ කෙසේ දැයි සඳහන් කරන්න. (ලකුණු 06)

(iii) "දරුවන්ගේ චර්යා සහ ආකල්ප කෙරෙහි ජනමාධ්‍යයේ බලපෑම පිළිබඳ දැඩි සැලකිල්ලක් දක්නට ලැබේ."

ඔබ ඉහත ප්‍රකාශය සමඟ එකඟ වන්නෙහි ද? ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 10)

හිමිකම් ඇවිරිණි.